සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

6 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි
- පළමු කොටසේ සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I - කොටස

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

01. තුසිත දෙව්ලොව වැඩ සිටින බෝසතුන් වෙත ගොස් මිනිස් ලොව උපදින ලෙස දේවාරාධනාව කළේ,
   (1) පස්වග මහණුන් ය.
   (2) සක්දෙව් රජු ය.
   (3) සහම්පතී මහා බ්‍රහ්මයා ය.
   (4) අසිත තාපස තුමා ය.

02. පස්මහ බැලුම්වලට අයත් නොවන්නෙකි,
   (1) කාලය (2) දීපය
   (3) ද්වේෂය (4) කුලය

03. බෝසතානන් වහන්සේ මව් කුස පිළිසිඳ ගනු ලැබුවේ,
   (1) වෙසක් පෝය දිනක ය.
   (2) පොසොන් පෝය දිනක ය.
   (3) ඇසල පෝය දිනක ය.
   (4) දුරුතු පෝය දිනක ය.

04. සිදුහත් කුමරුගේ ගිහි කල ගුරුවරයා වූයේ,
   (1) අසිත තාපස තුමා ය.
   (2) සර්වමිත්‍ර බමුණා ය.
   (3) කොණ්ඩඤ්ඤ තාපස තුමා ය.
   (4) දිසාපාමොක් ඇදුරු තුමා ය.

05. සිදුහත් කුමරු ඒකාන්තයෙන්ම බුදුවන බව ප්‍රකාශ කළේ,
   (1) අසිත හෙවත් කාලදේවල තාපස තුමා ය.
   (2) කොණ්ඩඤ්ඤ තාපස තුමා ය.
   (3) සර්වමිත්‍ර බමුණා ය.
   (4) සහම්පති මහා බ්‍රහ්මයා ය.

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න.**

(යසෝධරා / රාහුල පොඩි හාමුදුරුවන් / කිසාගෝතමිය / පහක් / එකොළහක්)

06. නිබ්බුත පද කියන ලද්දේ ........................................................................................................ කුමරිය විසිනි.

07. ගාථා නවයකින් යුතුව බුදු සිරුර වර්ණනා කරමින් නරසීහ ගාථා ප්‍රකාශ කරන ලද්දේ .................................. දේවිය විසින් ය.

08. ''මේ වැලි දෝතේ වැලි කැට ප්‍රමාණයට මට ගුරුවරුන්ගේ අවවාද ලැබේවා''යි යන ප්‍රකාශය කළේ ........................................................................................ ය.

09. මෙත් වැඩීමේ අනුසස් .................................................................................. ක් ඇතැයි බුදු දහමේ සඳහන් වේ.

10. සිඟාලෝවාද සූත්‍රයට අනුව දරුවන් විසින් දෙමාපියන් වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් .......................... ක් විස්තර කර තිබේ.

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල දැක්වෙන වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහනෙහි යොදන්න.**

11. යම් ක්‍රියාවක් නිසා පසුතැවේ ද, කඳුළු පිරි දෑසින් අඩමින් විපාක විඳීමට සිදුවේ ද, එවැනි ක්‍රියා සිදුකිරීම යහපත් ය. ( )

12. ලොව පවතින පණ ඇති, පණ නැති සෑම දෙයක් ම වෙනස්වීම අනිත්‍යයතාව යි. ( )

13. සීලය යනු සිත, කය, වචනයේ සංවර බවයි. ( )

14. සම්මා ආජීව යනු සීල ශික්ෂාවට අයත් අංගයකි. ( )

15. පුද්ගලයෙකුගේ පිරිහීම පිළිබඳ ව විස්තර කෙරෙන ජාතක කතාවකි අත්ථස්සද්වාර ජාතකය. ( )

- **අංක 16 සිට 20 දක්වා පහත A තීරුවේ දැක්වෙන වචනවලට ගැලපෙන B තීරුවේ සඳහන් ශාසනික වචන සමග නිවැරදිව ගළපා යා කරන්න.**

| | A | | B |
|---|---|---|---|
| 16. | යනවා | * | අමදිනවා |
| 17. | නිදනවා | * | පැන් |
| 18. | වතුර | * | වඩිනවා |
| 19. | අතුගානවා | * | වළඳනවා |
| 20. | කනවා | * | සැතපෙනවා |

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(i) පස් මහ බැලුම් අතරින් දෙකක් නම් කරන්න.

(ii) සිදුහත් කුමරු ඉපදුනේ කොහේ ද? කුමන පොහොය දිනක ද?

(iii) සුදොවුන් රජතුමා තම පුතුට පළමු වැඳීම සිදුවූයේ කුමන අවස්ථාවේ දී ද?

(iv) මහමායා දේවිය කලුරිය කළ පසු සිදුහත් කුමරු හදාවඩා ගත්තේ කවුරුන් විසින් ද?

(v) යසෝධරා දේවියගේ පියාගේ නම කුමක් ද?

(vi) සිදුහත් කුමරු ගිහි ජීවිතය අතහැර ගියේ කුමන පොහෝ දිනක ද?

(vii) ''බුදුබව ලබා පළමුව මාගේ රාජ්‍යයට වඩින්නැයි'' බෝසතාණන් වහන්සේගෙන් ඉල්ලා සිටි රජතුමාගේ නම ලියන්න.

(viii) බෝසතාණන් වහන්සේ දුෂ්කර ක්‍රියා කරන සමයේ උපස්ථාන කළේ කවුරුන් ද?

(ix) බෝසතාණන් වහන්සේට බුදුවීමට පෙර අන්තිම දානය පිරිනැමුවේ කවුරුන් විසින් ද?

(x) පුබ්බේනිවාසානුස්සති ඤාණය යනු කුමක් ද? (ලකුණු 2 x 10 = 20)

02. (i) විහාරස්ථානයට යන බෞද්ධයකු වන්දනාමාන කරන ස්ථාන තුන පිළිවෙළින් ලියන්න.

(ii) ත්‍රිවිධ චෛත්‍ය වන්දනා කරන ගාථාව ලියන්න.

(iii) විහාරස්ථානයට ඇතුළු වූ ඔබ විසින් සිදුකරන සිරිත් විරිත් පහක් ලියන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

03. (i) භාවනා වැඩීමට පෙර අපි විසින් සිදුකරන චාරිත්‍ර (සිරිත්) දෙකක් ලියා දක්වන්න.

(ii) භාවනා වැඩීම සඳහා වාඩිවිය හැකි පහසු ක්‍රම දෙක කුමක් ද?

(iii) මෛත්‍රී භාවනාව පුහුණු කිරීමෙන් ලැබිය හැකි අනුසස් (ආනිසංස) පහක් ලියන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

04. (i) රාහුල පොඩි හාමුදුරුවෝ රහත් බවට පත් වූයේ බුදුන්වහන්සේ විසින් දේශනා කළ කුමන සූත්‍ර දේශනාවට සවන්දීමෙන් ද?

(ii) බුදුරජාණන් වහන්සේ රාහුල පොඩි හාමුදුරුවන්ට ලබාදුන් අවවාද දෙකක් ලියන්න.

(iii) රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ තුනක් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

05. (i) ත්‍රිශික්ෂාව නම් කරන්න.

(ii) වචනයෙන් සිදුවන වැරදි හතර නම් කරන්න.

(iii) සිල්වත්ව කටයුතු කිරීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන 3 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

06. (i) සිව් බඹ විහරණයන් අතරින් දෙකක් නම් කරන්න.

(ii) සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් දෙමාපියන් විසින් දරුවන් වෙනුවෙන් ඉටුකරන යුතුකම්වලින් තුනක් සඳහන් කරන්න.

(iii) මව්පිය උපස්ථානයේ අගය පිළිබඳ වාක්‍ය පහක් ලියන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07. (i) රටට ආවේණික ජාතික සංකේත දෙකක් නම් කරන්න.

(ii) ජාතික කොඩියේ කහ තීරුවෙන් සංකේතවත් කරන්නේ කුමක් ද?

(iii) තම මව්බිම වෙනුවෙන් ඔබට කළ හැකි දේවල් පහක් සඳහන් කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | 3 | (02) | 3 | (03) | 3 | (04) | 2 | (05) | 2 | (06) | කිසාගෝතමිය |
| (07) | යසෝධරා දේවිය | (08) | රාහුල පොඩි හාමුදුරුවෝ | | | | | (09) | එකොළහක් | (10) | පහක් |
| (11) | ✗ | (12) | ✓ | (13) | ✗ | (14) | ✓ | (15) | ✗ | | |
| (16) | වඩිනවා | (17) | සැතපෙනවා | (18) | පැන් | (19) | අමදිනවා | (20) | වළඳනවා | | |

(ල. 2 x 20 = 40)

## II - කොටස

01. (i) කාලය, දීපය, දේශය, කුලය, මව්
(ii) ලුම්බිනිසල් උයනේ - වෙසක් පෝය
(iii) අසිත තාපසයාට පුත් කුමරු පෙන්වූ අවස්ථාවේ
(iv) මහා ප්‍රජාපතී ගෝතමී දේවිය
(v) සුප්‍රබුද්ධ රජු
(vi) ඇසල පෝය
(vii) බිම්බිසාර රජු
(viii) පස්වග තවුසන්
(ix) සුජාතා සිටු දුව
(x) පෙර භවයන් සිහි කිරීමේ නුවණ

(ලකුණු 2 x 10 = 20)

02. (i) ශාරීරික චෛත්‍ය - දාගැබ
පාරිභෝගික චෛත්‍ය - බෝධිය
උද්දේශික චෛත්‍ය - පිළිම ගෙය
(ii) වන්දාමි චේතියං සබ්බං
සබ්බඨානේ සුපතිට්ඨිතං
ශාරීරික ධාතු මහා බෝධිං
බුද්ධ රූපං සකලං සදා
(iii) හිස්වැසුම්, පාවහන් ගැලවීම. / කෑකෝ නොගැසීම. (නිශ්ශබ්ද වීම) / මළුව ඇමදීම. / මල් පහන් සූදානම් කිරීම ආදී ගැලපෙන පිළිතුරක්

(ලකුණු 2 + 3 + 5 = 10)

03. (i) පිරිසිදු වීම. / සුදුසු ස්ථානයක් තෝරාගැනීම. / තෙරුවන් වැඳීම. / පුද පූජා පැවැත්වීම ආදී ගැලපෙන සේ ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න.
(ii) බද්ධ පර්යංකය / අර්ධ පර්යංකය
(iii) සුවසේ නිදයි. / සුවසේ පිබිදෙයි. / නපුරු සිහින නොපෙනෙයි. / මනුශ්‍යයන්ට ප්‍රිය වේ. / අමනුෂ්‍යයන්ට ප්‍රිය වේ. (පෙළ පොත 33 පිටුව)

(ලකුණු 2 + 3 + 5 = 10)

04. (i) චූල්ල රාහුලෝවාද සූත්‍රය
(ii) පෙළ පොත 38, 39 පිටු
(iii) කීකරුකම, අවවාද පිළිගැනීම, ඇත්ත කථා කිරීම, අනතිමානී බව ආදී කරුණු කෙටියෙන් හඳුන්වා තිබීම.

(ලකුණු 2 + 3 + 5 = 10)

05. (i) සීල, සමාධි, ප්‍රඥා
(ii) බොරුකීම / කේලාම් කීම / පරුෂ වචන කීම / හිස් වචන කීම
(iii) පෙළ පොත පිටු අංක 48

(ලකුණු 2 + 3 + 5 = 10)

06. (i) මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා
(ii) දරුවන් පවින් වැළැක්වීම. / යහපතෙහි යෙදවීම. / ශිල්ප ඉගැන්වීම. / සුදුසු වයසේ දී ආවහ, විවාහ කරදීම. / සුදුසු කල දායාද පවරා දීම.
(iii) ගැලපෙන කරුණුවලට අදාළ පිළිතුරට ලකුණු ලබාදෙන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07. (1) ජාතික කොඩිය, ජාතික ගීය, ජාතික වෘක්ෂය, ජාතික පුෂ්පය
(2) සියලු ජාතීන් අතර එකමුතු බව එකිනෙකා අතර අවබෝධය
(3) ගැලපෙන පිළිතුරට ලකුණු ලබාදෙන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)